සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

8 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සහ 02 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සිරිමල් දෙස බලා සිටි සුගතපාල මාමා ''<u>එකා යකා වෙලා</u>'' යැයි පැවසී ය.

(i) ළඟකදී යක්ෂයෙකු වැසී ඇති බව. (ii) දැඩි ලෙස අකීකරු වී ඇත.

(iii) යක්ෂ කුලයකින් පැවත එන බව. (iv) ඉතා කරදරකාරී අයෙකු බව.

02 විදුහල්පතිතුමා තමා කළ වැඩය බලා සිටිනු දුටු මුරුගේෂන්ට <u>දවල් තරු පෙනුණි.</u>

(i) හොඳටම කේන්ති ගියා (ii) හොඳටම දාඩිය දැම්මා

(iii) හොඳටම බය වුණා (iv) ඉක්මනින් අහස දෙස බැලුණා

- අංක 03 සහ 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය අඩංගු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

03 (i) පෘතුල (ii) වර්දණය (iii) කළමනාකරන (iv) මර්දනය

04 (i) පළතුරු (ii) නිශ්පාදන (iii) කෘත්‍රිම (iv) මුග්ද

- අංක 05 සහ 06 ප්‍රශ්නවල නිවැරදි අකාරාදි පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

05 (i) දඩල්ල, දූරණියගල, දික්වැල්ල, දෙවිනුවර (ii) දඩල්ල, දූරණියගල, දෙවිනුවර, දික්වැල්ල

(iii) දෙවිනුවර, දික්වැල්ල, දඹගල්ල, දූරණියගල (iv) දික්වැල්ල, දූරණියගල, දෙවිනුවර, දඹගල්ල

06 (i) ඌරු, අලි, කොටි, වළස් (ii) අලි, කොටි. වළස්, ඌරු

(iii) අලි, කොටි, ඌරු, වළස් (iv) අලි, ඌරු, කොටි, වළස්

07 සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණ වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අඹ (ii) හඳ (iii) වඳ (iv) හොඬ

08 මහාප්‍රාණ අක්ෂරයක් යෙදුණ වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) දොඹ (ii) ප්‍රබල (iii) ළපටි (iv) පඨය

09 මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) රඟමින්. පැන, දුවයි (ii) බලමින්, තබා, රඟයි

(iii) නට නටා, සෝදා, කියවයි (iv) ගයා, ලියවයි, කරයි

10 පහත සඳහන් සාම්ප්‍රදායික යෙදුම කවර වර්ගයකට අයත් දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

''අත හයිය නම් බත නොවරදින්නා වගේ''

(i) ප්‍රස්තාව පිරුළකි. (ii) ආප්තෝපදේශයකි.

(iii) යුගල පදයකි. (iv) රූඪී පදයකි.

11 පහත සඳහන් වාක්‍යයෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

බල්ලා දුටු මල්ලී පවනට බඳු වේගයෙන් <u>දිව්වේ ය</u>.

(i) පූර්ව ක්‍රියා පදයකි. (ii) මිශ්‍ර ක්‍රියා පදයකි.

(iii) අවසාන ක්‍රියා පදයකි. (iv) අසම්භාව්‍ය ක්‍රියා පදයකි.

12 පහත සඳහන් වචනවල අර්ථය හිස්තැන්වල ලියන්න.

(i) පෘථුල .................................... (ii) ආචීර්ණ කල්පිත ....................................

13 පහත සඳහන් වචනවල විරුද්ධාර්ථ පදය හිස්තැන්වල ලියන්න.

(i) ලෝභී .................................... (ii) නිශ්චල ....................................

14 පහත සඳහන් වචනවලට සමානාර්ථ පදය බැගින් ලියන්න.

(i) නෙළුම.................................... (ii) අහස ....................................

15 පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන නිවැරදි පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අම්මා කළ ගෙඩිය රැගෙන ලහි ලහියේ .................................. (නල / නළ) ළිඳ වෙතට පිය මැන්නා ය.

(ii) වෙඩි කෑ ඌරෙකුගේ ප්‍රහාරයට ලක් වූ ඔහුගේ කකුලේ විශාල .............................. (වණයකි / වනයකි)

16 පහත සඳහන් කවියෙහි සඳහන් උපමාව සහ උපමේය වෙන් කර ලියා දක්වන්න.

මගේ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නේ පිනි බින්දුත්
හඳමු එකක් ඒ වාගේ

(i) උපමාව .................................... (ii) උපමේය ....................................

17 පහත සඳහන් වාක්‍ය සඳහා සුදුසු අතීතකාල ආඛ්‍යාත පද යොදන්න.

(i) එතනහාමි උජාරුවෙන් හවරිය තබා කොණ්ඩය ....................................

(ii) ඩිංගිරාල මඩක්කුවේ තිබූ හොදි බෙදාගෙන බත් රස කර කර ....................................

18 පහත සඳහන් වචන දෙකෙහි අනුක්ත පද ලියන්න.

(i) මී මැස්සෝ .................................... (ii) ගැහැනියක් ....................................

19 පහත සඳහන් කවි දෙපදයෙහි ඉරි ඇඳි පදවල තේරුම ලියන්න.

පතසන් අවර ගිරි තැටියෙන් වැටෙන කල
<u>විලිකුන්</u> <u>සුරත්</u> පල වැනි මේ රිවි මඬල

(i) විලිකුන් .................................... (ii) සුරත් ....................................

20 පහත සඳහන් යුගල පද සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

(i) රොඩු .................................... (ii) ඇද ....................................
ඇත .................................... තාඩන ....................................

(ලකුණු 2 x 20 = 40)

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **පළමුවන, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු ලියන්න.**

01 (i) නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර ගණන වෙන වෙනම ලියන්න.

(ii) 1. සාහිත්‍ය සඳහා නොබෙල් ත්‍යාගය දිනාගත් ප්‍රථම ආසියාතිකයා කවුද?

2. මොහු නොබෙල් සාහිත්‍ය සම්මානය හිමිකරගත් කෘතියේ නම කුමක් ද?

(iii) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ දේශාභිමානි හැඟීම් දනවන කෘති 2 ක් නම් කරන්න.

(iv) සුදෝ සුදු වැ වලාකුළෙනි
ඇයි මේ සිල් ගත්තා වැනි
මෙම පද්‍ය කොටසේ ඇති උපමාව හා උපමේය වෙන වෙනම ලියන්න.

(v) පහත සඳහන් කවිය විරිතට අනුව හිස්ව ඇති පද දෙක කැමති පරිදි සම්පූර්ණ කරන්න.
රස පල සුවඳ කුසුමින් තුරු හිස ........ පිරෙන
උණුසුම සිසිල සම ලෙස හැමවෙත ........ පුදන

..............................................................................

.............................................................................. (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) උගත මනා ශිල්පයමයි මතු රැකෙනා.

(ii) වනපෙත සුරකිමු.

(iii) අලුත් අවුරුදු සිරිත් විරිත් සිරි අසිරිය.

(iv) යහපත් සෞඛ්‍ය පුරුදු පිළිපදිමු.

(v) අලුත් ග්‍රහලෝකයක ජීවත් වෙන්න ලැබුණොත්. (ලකුණු 20 යි.)

03 මෙවර ඔබ පාසලේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවයට සහභාගි වන ලෙස දන්වමින් ආරාධිත අමුත්තන් සඳහා යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 10 යි.)

04 පහත සඳහන් වාක්‍ය <u>අතීත කාල බහුවචනයට</u> හරවා නැවත ලියන්න.

(i) මම හොඳින් ඉගෙන ගනිමි.

(ii) නුඹ ගමට යන්නෙහි.

(iii) තෝ පාඩම් කරන්නෙහි.

(iv) ක්‍රීඩකයා පිටියට පිවිසෙයි.

(v) නර්තන ශිල්පිනිය රංගනයක යෙදෙන්නීය.

(vi) මගියා පදික වේදිකාවේ ගමන් කරයි.

(vii) මම දක්ෂ ශිෂ්‍යයෙක් වෙමි.

(viii) මල සුවඳ විහිදුවයි.

(ix) බල්ලා කෑදරකමින් මස්කට්ට සපාකයි.

(x) බසය පවනට බඳු වේගයෙන් ධාවනය වෙයි. (ලකුණු 1 x 10 = 10)

05 පහත සඳහන් ප්‍රකාශ ඇසුරින් දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

(i) ''මේකෙ හැඩේ දිගටියටත් තියෙනවා. රවුමටත් තියෙනවා.''

(ii) ''ඒ කතාව හරියට ම හරි පුතේ. අපි කාටත් විවේකය ඕනෑ....''

(iii) ''හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්තිවෙලා එන්න පුළුවන් ද?''

(iv) ''දෙයියනේ... මොනවද මේ කාලා තියෙන්නේ...''

(v) ''... මට දැන් ඉස්කෝලේ ගිහින් මගේ යාළුවන්ටත් ඒ දේවල් කියාදෙන්න පුළුවන්...''

| අනු අංකය | පාඩමේ නම | කිව්වේ කවුද? | කිවේ කා හටද? | කියූ අවස්ථාව |
|---|---|---|---|---|
| (i) | | | | |
| (ii) | | | | |
| (iii) | | | | |
| (iv) | | | | |
| (v) | | | | |

(ලකුණු 2 x 5 = 10)

06 පහත සඳහන් ක්‍රියාපද යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

(i) කරවයි (ii) සෝදා (iii) ගයගයා (iv) දුවන්නීය

(v) ගියෙහු (ලකුණු 2 x 5 = 10)

07 පහත සඳහන් ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

අද පමණක් නොවේ අපට හෙටක් තියෙනවා
අරුණළු කැන් හිනැහී නව දිනක් ලබනවා
අඳුරෙන් බර ආකර තුළ මැණික් දිලෙනවා
දෙස බස රැස අපේ අතින් එළිය වැටෙනවා

උදාසීන ජාතිය නිදි කිරා වැටෙන්නේ
උදරතර හැඟුම් පැතුම් නැත ලියලන්නේ
උදගිරෙන් උදා වෙමින් හිරු එනවා සේ
නවෝදයක් බිහිකරලමු අපි ඉතිහාසේ

මුනිසිරිපා පියුම් පිපුණ - මේ මහ දෙරණෙයි
දිගන්තයේ ජය දද නැගූ හෙළ දෑ වරුණයි
එම බැතියෙන් අභිමානෙන් මුළු ලොව සුවඳයි
මෙම නිවහන් දිවිහිමියෙන් අපහට අරුමයි

ගායනය: විශාරද නන්දා මාලනී ඇතුළු පිරිස

(i) මෙම ගීතය කුමන ගීත වර්ගයට අයත් වේද?

(ii) 1. අඳුරෙන් බර ආකර තුළ දිලෙන්නේ මොනවා ද?

2. අපේ අතින් එළිය වන්නේ මොනවා ද?

(iii) උදසීන ජාතිය තුළ දක්නට ලැබෙන ගතිලක්ෂණ දෙකක් ලියන්න.

(iv) ''හෙළ දෑ'' යන්නෙහි සරල තේරුම කුමක් ද?

(v) පහත සඳහන් පද සඳහා සමානාර්ථ දෙන පදය බැගින් ගීතයෙන් තෝරා ලියන්න.

1. මිණි 2. අලස 3. නෙළුම් 4. මිහිකත (ලකුණු 2 x 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) iii (03) iv (04) iii (05) i (06) iv (07) ii (08) iv
(09) iii (10) i (11) iii
(12) i. පුළුල් ii. යල් පිනූ, කල්ගිය, ඉපැරණි යුගයට අයත්
(13) i. නිර්ලෝභි ii. චංචල
(14) i. පියුම, අරවින්ද. කමල, සියපත ii. අඹර, සුරමඟ, නුඹ, ආකාශය. පවන් මග, අවකාශය
(15) i. නළ ii. වණයකි
(16) i. මාලේ මුතු ඇට ii. පිනි බිංදු
(17) i. බැන්දාය ii. කැවේය
(18) i. මී මැස්සන් ii. ගැහැනියක
(19) i. ඉදුණු ii. ඉතා රතු, තද රතු
(20) i. බොඩු / මැත ii. කුද / පීඩන

## II කොටස

01 (i) ස්වර 18 / ව්‍යඤ්ජන 42
(ii) 1. රබීන්ද්‍රනාත් තාගෝර් තුමා 2. ගිතාංජලී
(iii) නිදහසේ මන්ත්‍රය, නිදහසේ දහැන, ලංකා මාතා, දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල
(iv) උපමාව - සිල්ගත්තා වැනිය / උපමේය - වලාකුළ
(v) සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2 x 5 = 10)

02 සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 20 යි.)

03 සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 10 යි.)

04 (i) අපි හොඳින් ඉගෙන ගත්තෙමු/ ගතිමු. (ii) නුඹලා ගමට ගියෙහු.
(iii) තොපි පාඩම් කළෙහු. (iv) ක්‍රීඩකයෝ පිටියට පිවිසුණාහ / පිවිසුණෝ ය.
(v) නර්තන ශිල්පිනියෝ රංගනයක යෙදුණාහ / යෙදුණෝ ය.
(vi) මගීහු පදික වේදිකාවේ ගමන් කළහ/කළෝය. (vii) අපි දක්ෂ ශිෂ්‍යයෝ වූයෙමු / වුණෙමු.
(viii) මල් සුවඳ විහිදුවේ ය. (ix) බල්ලෝ කෑදරකමින් මස්කටු සපා කෑහ / කෑවෝය.
(x) බස් පවනට බඳු වේගයෙන් ධාවනය විය / වූයෝය. (ලකුණු 1 x 10 = 10)

05

| අනු අංකය | පාඩමේ නම | කිව්වේ කවුද? | කිවේ කා හටද? | කියූ අවස්ථාව |
|---|---|---|---|---|
| (i) | එතනහාමි | සාස්තරකාරයා | එතනහාමිට හා ඩිංගි රාළට | නැතිවූ හවරිය ගැන සාස්තරය අසන අවස්ථාව |
| (ii) | අලුත් අවුරුදු උත්සවය | සීයා | මුනුබුරාට | සිංහල අවුරුදු චාරිත්‍ර ගැන කතාකරන අවස්ථාව |
| (iii) | කතාබහට අවධානය | ඉස්කෝලෙ මහත්තයා | මුදලිහාමිට | මුදලිහාමිට කොළඹ යාමට කතාකළ අවස්ථාව |
| (iv) | එතනහාමි | එතනහාමි | ඩිංගිරාළට | ඩිංගිරාල හාල් සේදූ වතුර සමග බත් කෑ බව දැනගත් අවස්ථාව |
| (v) | අලුත් අවුරුදු උත්සවය | පුතා | තාත්තාට | අලුත් අවුරුදු උත්සවය ගැන තොරතුරු දැනගත් අවස්ථාව |

(ලකුණු 2 x 5 = 10)

06 නිවැරදි වාක්‍ය සඳහා ලකුණු ලබාදෙන්න. (ලකුණු 1 x 10 = 10)

07 (i) දේශාභිමානී ගීත
(ii) 1. මැණික් 2. දෙස, බස, රැස
(iii) 1. නිදි කිරා වැටීම 2. උදරතර හැඟුම්, පැතුම් නොමැති වීම
(iv) සිංහල ජාතිය
(v) 1. මැණික් 2. උදසින 3. පියුම් 4. දෙරණ (ලකුණු 2 x 5 = 10)